(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 164.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2012 පෙබරවාරි මස 08 වැනි බදාදා අ. භා. 1.00 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1065/'11

1\.

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ආයෝජන මණ්ඩල ගිවිසුමේ 16 සහ 17 වගන්ති යටතේ 2009, 2010 සහ 2011 වර්ෂයේ මේ දක්වා පිහිටුවන ලද කර්මාන්තශාලා තුළින් අපේක්ෂා කළ මුළු රැකියා සංඛ්‍යාව කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අලුතින් පිහිටුවන ලද ආයෝජන මණ්ඩල සමාගම්හි වාර්ෂික අපනයන ශක්‍යතාවයේ ප්‍රමාණය කවරේද;

(ii) ආයෝජනයන් සිදු කළ ප්‍රධාන රටවල් මොනවාද;

(iii) බදු ගෙවීමට නියමිත දිනයේ සිට ඉහත කී ආයෝජනවලින් අපේක්ෂිත බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1167/'11

2\.

ගරු අනුර දිසානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2009 වර්ෂයේදී අයි. ඕ. සී. (IOC) නමැති ඉන්දියානු සමාගමට බදු නිදහස් පදනමින් ඉන්ධන පිරවුම් හල් 100 ක් ලබා දී තිබේද;

(ii) එම ඉන්ධන පිරවුම්හල්වලින් රජයට බදු ගෙවිය යුතු වන්නේද;

(iii) එසේ නම්, 2006, 2007, 2008 සහ 2009 වර්ෂවලදී රජයට ගෙවන ලද බදු වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉන්ධන පිරවුම්හල්වලින් ගෙවීම පැහැර හරින ලද බදු රජයට ගෙවන ලෙස ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් අයි. ඕ. සී. සමාගම වෙත දන්වා තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම සමාගම බදු ගෙවිය යුතු නැති බව ආයෝජන මණ්ඩල සභාපතිවරයා විසින්ම නැවත අදාළ සමාගමට දන්වා තිබේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

(v) එවැනි දැනුම්දීමක් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අයි. ඕ. සී. සමාගම රජයට ගෙවිය යුතු බදු නොගෙවා පැහැර හැරීමට එරෙහිව ගනු ලබන පියවර කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1399/'11

3.

ගරු බුද්ධික පතිරණ මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මොනරාගල දිස්ත්‍රික්කයේ, මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, මුල්ලේගම හා නෙල්ලියද්ද ගම්මානවල පදිංචි පවුල් දෙදහසක් පමණ විදුලිය නොමැතිවීමෙන් දැඩි දුෂ්කරතාවන්ට මුහුණපා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ගම්මානවල බොහෝ නිවෙස්වලට ඉන්දියානු රජයේ ආධාර මත සූර්ය කෝෂ ලබාදී තිබුණද, ඒවා අක්‍රීය තත්ත්වයේ පවතින බවත්;

(ii) ඌව උදානය වැඩසටහන යටතේ මෙම ප්‍රදේශයට විදුලිය ලබා දීම සඳහා මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඇස්තමේන්තු ඉදිරිපත් කර තිබුණද මේ දක්වා ක්‍රියාත්මක වී නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) එම ගම්මානවල ජනතාවට කඩිනමින් විදුලිය ලබාදීමට පියවර ගන්නේද;

(ii) ඊට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(iii) එසේ නම්, එම මුදල කොපමණද;

(iv) විදුලිය ලබාදීමේ කටයුතු ආරම්භ කරන්නේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1491/'11

4.

ගරු අජිත් කුමාර මහතා,— රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ, මේ වනවිට සේවය කරන උපදේශකයින් සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්, අධ්‍යාපන සුදුසුකම් සහ වගකීම්;

(iii) ඔවුන් වෙත ගෙවනු ලබන වැටුප් සහ දීමනා;

(iv) පසුගිය මාසය සඳහා ගෙවන ලද සියලු දීමනාවල එකතුව;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නිලරථ ලබාදී ඇති උපදේශකයින්ගේ නම්, ලබාදී ඇති නිලරථ සංඛ්‍යාව සහ ඒවායේ විස්තර කවරේද;

(ii) ඔවුන් වෙත ඉන්ධන දීමනා ලබාදෙන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබාදෙන ඉන්ධන දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඔවුන් වෙත දුරකථන පහසුකම් ලබා දෙන්නේ නම්, මේ වන විට දුරකථන පහසුකම් ලබා දී ඇති උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) දුරකථන දීමනාවක් ගෙවන්නේ නම්, එක් එක් උපදේශකවරයාට ලබා දී ඇති දීමනාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1595/'11

5\.

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "එලියන්ත වයිට්" නමැති අයෙකු ජනාධිපති උපදේශකවරයෙකු වශයෙන් කටයුතුකර තිබේද;

(ii) එම පුද්ගලයා රජයේ වෙනත් කිසියම් තනතුරක් දරා තිබේද;

(iii) "එලියන්ත වයිට්" නමැති අය වෙත රජය විසින් ගෙවා ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) "එලියන්ත වයිට්" නමැති අයට විරුද්ධව මුදල් අක්‍රමිකතා පිළිබඳව චෝදනා ඉදිරිපත්කර තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව නීතිමය පියවර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1714/'11

6\.

ගරු තිස්ස අත්තනායක මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරියේ සේවක සේවිකාවන් විශ්‍රාම ගැන්වීමේ යෝජනාවලියක් වරාය අධිකාරියේ චක්‍රලේඛ අංක 03/2011 යටතේ නිකුත්කර ඇති බවත්;

(ii) එම චක්‍රලේඛය අනුව ශ්‍රී ලංකා වරාය අධිකාරියේ වර්ෂ දහයක අවම සේවා කාලයක් සපුරා ඇති ඉදිරියට වර්ෂ පහක් සේවය කිරීමට ඇති සේවකයින්ට රුපියල් ලක්ෂ විස්සක උපරිමයට යටත්ව අදාළ වන්දි මුදල් ලබාගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා වරාය අධිකාරිය මගින් කොළඹ වරාය පුළුල් කිරීම, හම්බන්තොට නව වරාය ඉදි කිරීම සහ සෙසු වරායවල් වැඩි දියුණු කිරීමේ කටයුතු සිදු කරමින් සිටියදී වරාය සේවකයින් විශ්‍රාම ගැන්වීමට පියවර ගනු ලබන පදනම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පසුගිය කාලසීමාව තුළ දේශපාලන බලපෑම් මත සිදු කළ අත්‍යවශ්‍ය නොවන බඳවා ගැනීම හේතුවෙන් වරාය අධිකාරියේ සේවක අතිරික්තයක් ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1718/'11

7\.

ගරු දයාසිරි ජයසේකර මහතා,— ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයට අයත් ව්‍යවස්ථාපිත මණ්ඩල හා සංස්ථා කවරේද;

(ii) එම එක් එක් ආයතන වෙනුවෙන් පත්කොට ඇති සභාපතිවරුන් කවුරුන්ද;

(iii) එම සභාපතිවරුන් පත්කරන ලද බලධාරියා කවුරුන්ද;

(iv) එම සභාපතිවරුන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය පළපුරුද්ද කවරේද;

(v) එම එක් එක් සභාපතිවරයා වෙනුවෙන් ගෙවනු ලබන වැටුප් හෝ දීමනා, ලබා දී ඇති වාහන, දුරකතන ඇතුළු පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1726/'11

8\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හිඟුරාණ සීනි කර්මාන්තශාලාව සතු ඉඩම් ප්‍රමාණය කොපමණද;

(ii) එම ආයතනය සතු අනෙකුත් දේපල කවරේද;

(iii) එම දේපලවල ප්‍රමාණයන් කවරේද;

(iv) මේ වන විට හිඟුරාණ සීනි කර්මාන්තශාලාව ආශ්‍රිතව උක් වගා කර ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එම වගා බිම් ප්‍රමාණයෙන්, ආයතනය විසින් වගාකළ සහ ගොවියන් විසින් වගාකළ ප්‍රමාණ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වගා කරන ලද උක් දඬු එම කර්මාන්තශාලාව විසින් මිලදී ගන්නේද;

(ii) එසේ නම්, උක් දඬු ටොන් එකක මිල කොපමණද;

(iii) කර්මාන්තශාලාව විසින් මිලදී නොගන්නේ නම්, කර්මාන්තශාලාවේ හා ගොවියන්ගේ උක් දඬු මිලදී ගනු ලබන ආයතනය කුමක්ද;

(iv) එම ආයතනය උක් දඬු ටොන් එකක් වෙනුවෙන් ගෙවන මිල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හිඟුරාණ සීනි කර්මාන්තශාලාවේ උක් ඇඹරීමටත්, සීනි නිෂ්පාදනය කිරීමටත් බලාපොරොත්තු වන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1803/’11

9.

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තණමල්විල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ, සෙවනගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉඳිකොලපැලැස්ස ග්‍රාම නිලධාරී වසමේ, ගැමුණුපුර වටරවුම් පාර ''ගැමුණු ගොවි සංවිධානය'' මගින් පිළිසකර කරන ලද බවත්;

(ii) ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය සමග එම ගොවි සංවිධානය අත්සන් කරන ලද ගිවිසුමට අනුව අංක 419 දරන ගෙවීම් වවුචරයෙන් ඉටු කරන ලද වැඩ සඳහා රු. 801,089. 99ක් ලබා ගෙන ඇති බවත්;

(iii) ඉහත මාර්ගයේම මීටර් 665ක් ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරියේ ගිවිසුම්ගත වැඩ සඳහාම ''ගැමුණු ගොවි සංවිධානය'' විසින් තණමල්විල ප්‍රාදේශීය සභාවෙන් රු. 588,858.25 ක් ලබාගෙන ඇති බවත්;

(iv) විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂණයට අනුව එකම කාර්යයක් වෙනුවෙන් ආයතන දෙකකින් ''ගැමුණු ගොවි සංවිධානය'' නමින් වංචනික ලෙස මුදල් ලබාගෙන ඇති බව සනාථ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත වංචනික ක්‍රියාවට වගකිව යුතු පුද්ගලයින්ට විරුද්ධව නීතිමය පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1859/’11

10.

ගරු සිවශක්ති ආනන්දන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව නගර සභාවට අයත් ගවමස් හා එළුමස් වෙළඳසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වෙළඳසැල් පිහිටා ඇති ස්ථාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පූන්තෝට්ටම්, කුරුමන්කාඩු හා වවුනියාව පොළ අසල පිහිටි ගවමස් වෙළඳ සැල් හා කුරුමන්කාඩු හා වවුනියාව පොළ අසල පිහිටි එළුමස් වෙළඳසැල් බදුදීමේදී ටෙන්ඩර් කැඳවීමක් හෝ ප්‍රසිද්ධ වෙන්දේසි කිරීමක් සිදු කළේද;

(ii) 2009, 2010 සහ 2011 වර්ෂවලදී එම එක් එක් වෙළඳසැල බදු දුන් මුදල හා බදුගත් පාර්ශ්වයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) 2011.06.29 දින පැවැති නගර සභා රැස්වීම් වාර්තා අනුව වවුනියාව පොළ අසල පිහිටි ගවමස් වෙළඳසැල එස්. කේ. කාදර් නැමැති අයට රු. 859,711.05කට හා එළුමස් වෙළඳසැල කේ. කේ. මස්තාන් නමැති අයට රු. 79,315.50කට ටෙන්ඩර් කැඳවීමකින් තොරව අඩු මුදලකට ලබා දී ඇති බවත්;

(ii) එමගින් සභාවට ඉහත වර්ෂ තුනට අදාළව රුපියල් කෝටියක පමණ අලාභයක් සිදු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, ඊට වගකිවයුත්තන්ගෙන් එම මුදල් අයකර ගැනීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

1862/'11

11.

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඇල්කඩුව වැවිලි සමාගමට අයත් වතු සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(ii) සේවකයින් බඳවා ගැනීම, ඉවත් කිරීම හා සේවය දීර්ඝ කිරීමේ පූර්ණ බලතල එම සමාගමේ පරිපාලනය සතුවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත වැවිලි සමාගමේ වත්මන් සභාපතිවරයා වැවිලි ක්ෂේත්‍රය තුළ දූෂණ හා වංචා සිදු කළ අයෙකු බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම දූෂණ හා වංචා සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කරන්නේද;

(ii) එම පරීක්ෂණයේ ප්‍රගතිය කවරේද;

(iii) එම පරීක්ෂණයෙන් එම සභාපතිවරයා වරදකරුවකු වුවහොත් ගන්නා ක්‍රියාමාර්ගය කවරේද;

(iv) එම සභාපතිවරයා ඉදිරිපත් කරන ඇල්කඩුව වැවිලි සමාගමේ ගිණුම් වාර්තා පිළිගත හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ඉහත සමාගමේ 2007-2010 වර්ෂ තුළ ලාභ ලැබූ වතු සංඛ්‍යාව කොපමණද;

(ii) අලාභ ලැබුවේ නම්, එම අලාභය කොපමණද;

(iii) දූෂණ සහ අක්‍රමිකතා ඊට හේතු වූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) (i) එම සමාගම සඳහා කෝප් වාර්තාවක නිර්දේශයක් පරිදි ආශ්‍රිත මෙහෙයුම් කාර්යාලයක් ඉදිකර තිබේද;

(ii) එය ඉදිකිරීමට හේතුව කවරේද;

(iii) ඒ සඳහා වැයවූ මුදල කොපමණද;

(iv) එම කාර්යාලයේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඊ) නොඑසේ නම්, ඒ මන්ද?

1872/'11

12.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකන් ගුවන් සේවයට සහ මිහින් ලංකා ගුවන් සේවයට අයත් ගුවන් යානා සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ගුවන් යානා අතුරින් කල්බදු ක්‍රමය යටතේ ලබාගෙන ඇති ගුවන් යානා සංඛ්‍යාව ගුවන් සේවය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම එක් එක් ගුවන් යානාව සඳහා මාසිකව ගෙවනු ලබන කුලිය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ශ්‍රී ලංකන් ගුවන් සේවය පසුගිය වර්ෂ තුන තුළදී උපයා ගත් ශුද්ධ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ශ්‍රී ලංකන් ගුවන් සමාගමට ඉදිරි වර්ෂ පහක කාලයකට හා මිහින් ලංකා ගුවන් සමාගමට ඉදිරි වර්ෂ දෙකකට ලැබී ඇති ප්‍රාග්ධන ආයෝජන වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රාග්ධන ආයෝජන ඉහත ගුවන් සමාගම් දෙකෙහි උන්නතිය සඳහා යෙදවීමට සැලසුම්කර තිබේද;

(iii) එසේ නම්, එම සැලසුම් එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1900/'11

13.
ගරු ජෝන් අමරතුංග මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පුස්තකාලයාධිපති සේවය, භාෂා පරිවර්තන සේවය, රියදුරු සේවය යන සේවාවල කටයුතු කිරීම සඳහා පත්කර සිටි සහකාර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂවරිය 2010.11.30 දින සිට ස්ථාන මාරු ලබාගොස් ඇති අතර මෙතෙක් එම තනතුරට කිසිවෙකු පත් නොකිරීම නිසා ඉහත සේවාවල බඳවාගැනීම්, උසස් කිරීම්, ස්ථාන මාරුකිරීම්, සේවා ව්‍යවස්ථා සෑදීම සහ සංශෝධනය කිරීම් යන කටයුතු ප්‍රමාද වී ඇති බව සහ ඇතැම් සේවාවල කටයුතු ඇනහිට ඇති බවත් එතුමා දන්නෙහිද?

(ආ) (i) සහකාර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂවරයාගේ හිස්වූ තනතුර සඳහා මේ වන විට කිසිවෙකු පත් කර තිබේද;

(ii) එසේ නම්, එම තනතුරට පත් කරන ලද නිලධාරියා කවුරුන්ද;

(iii) එම පත්වීම සිදුකළ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඉහත තනතුර සඳහා මෙතෙක් කිසිවකු පත්කර නොමැති නම්, ඒ සඳහා කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1901/'11

14.
ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හොරොව්පොතාන, ගලෙන්බිඳුනුවැව ග්‍රාමයට විදුලිය ලබා දෙන ලෙස ගම්වාසීන් ඉල්ලා සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ගලෙන්බිදුනවැව ගම්මානයේ සිට කිලෝ මීටරයක් දුරින් ඇද ඇති අධිබල විදුලි රැහැන් වෙතින් එම ගමටද විදුලිය සපයා දීමටත්;

(ii) ඊට අදාළව නව ට්‍රාන්ස්පෝමරයක් පිහිටුවීමේ අවශ්‍යතාව අනුව එය ස්ථාපිත කිරීමටත්;

එතුමා කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1911/’11

15\.
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා,— නැවත පදිංචි කිරීමේ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2001 මැයි මස කැබිනට් අනුමතිය ලැබුණු “ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීමේ ජාතික ප්‍රතිපත්තියේ” නියමයන්ට අනුකූලව;

(i) ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීම් සිදු කරන්නේ එය නොවැළැක්විය හැකි වුවහොත් පමණක් බවත්;

(ii) නැවත පිහිටුවීමේ ස්ථාන තෝරාගැනීම, ජීවන දීමනා සහ සංවර්ධන විකල්ප තීරණය කරනු ලබන්නේ බලපෑමට ලක්වූ පුද්ගලයින්ගෙන් සම්පූර්ණ තොරතුරු විමසීමකින් පසුව බවත්;

(iii) ආදේශක ඉඩම් සැපයීම හෝ වන්දි වශයෙන් මුදල් ගෙවීම සිදු කරනු ලබන්නේ නැතිවූ ඉඩම්, ඉදිකිරීම් සහ ජීවිකා වෘත්තීන් සලකා බැලීමෙන් පසුව බවත්;

(iv) මුළු ඉඩම සඳහා කඩිනමින් ප්‍රතිසම්පාදන අගයන් වශයෙන් වන්දි පිරිනැමෙන බවත්;

(v) ඉඩම් සඳහා ලේඛනගත හිමිකමක් නැති පුද්ගලයින්ටද සාධාරණ සැලකිල්ලක් දැක්වෙන බවත්; සහ

(vi) බලපෑමට ලක්වූ පුද්ගලයින් ප්‍රතිස්ථාපනය කිරීමට උදව් දෙන බව සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණු කර ගැනීමට පහසුකම් සැපයෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 2010 ජනවාරි සිට කොළඹ නගර සභාව තුළ ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීමේ ජාතික ප්‍රතිපත්තිය පිළිපදින ලද අවස්ථා සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතන කවරේද; සහ

(ii) සියලුම මහ නගර සභා, නාගරික මධ්‍යස්ථාන සහ අගනගරවල ස්වකැමැත්තෙන් නොවන නැවත පදිංචිකිරීමේ ජාතික ප්‍රතිපත්තිය තදින්ම ක්‍රියාත්මක කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

### යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 6.30 දක්වා විය යුතු ය. අ. භා. 2.00 ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— වරප්‍රසාද,— "Cabraal blames AG for delay in auditing EPF Accounts" ශීර්ෂය යටතේ "දි අයිලන්ඩ්" පුවත්පතේ පළවූ වාර්තාව මගින් තම වරප්‍රසාද කඩ වී ඇති බවට පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා විසින් 2012 ජනවාරි මස 18 වැනි දින පාර්ලිමේන්තුවේදී මතු කරන ලද කරුණු ස්ථාවර නියෝග 127 යටතේ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු ය.

3.

ගරු ෆයිසාල් කාසිම් මහතා,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 1),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"සෙය්යිද් ෂේහ් කෝයා තංගල් මවුලානා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

4.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය,— පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමේ අවසරය (අංක 2),— පහත සඳහන් පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය:—

"පිලිප් ගුණවර්ධන ගුණානුස්මරණ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ජාතික මංමාවත් පනත යටතේ නියෝග,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනුව්‍යවස්ථාව සහ 2008 අංක 40 දරන ජාතික මංමාවත් පනතේ 13 සහ 14 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එම පනතේ 89 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ, ගාස්තු ගෙවිය යුතු ජාතික මහාමාර්ගයේ භාවිතා කරන සෑම වාහනයකම රියදුරකුගෙන්ම අය කළ යුතු ගාස්තු පිළිබඳව ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2011 නොවැම්බර් 18 දිනැති අංක 1732/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරනු ලැබ, 2012.01.17 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*2.

රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*6.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — කාරක සභාව.

*7.

කෘෂිකර්ම අමාත්‍යතුමා,— පළිබෝධනාශක පාලනය කිරීමේ පනත යටතේ නියෝග,— 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 26 වැනි වගන්තිය යටතේ කෘෂිකර්ම අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 ජූලි 27 දිනැති අංක 1716/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*8.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නියමය,— (52 වැනි අධිකාරිය වූ) සුරාබදු ආඥාපනතේ 25 වැනි වගන්තිය යටතේ, සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ අනුමතිය ලත් හෝටල් තුළ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2011 ජනවාරි 21 දිනැති අංක 1689/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.02.10 දින ඉදිරිපත්කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අංක 935 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2011 සැප්තැම්බර් 08),— “2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 මැයි 30 දිනැති අංක 1708/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.08.23 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.” යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*11.

ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වන) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

12.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

රාජ්‍ය සේවක සංවර්ධන මූල්‍ය සංස්ථාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**